# කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.

කිංසි පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව.

දුරකථන: +94-0-11-2695300 දිගුව : 119, 120 ෆැක්ස් : +94-0-11-2691581

විද්‍යුත් ලිපිනය :head@anat.cmb.ac.lk


---

මහත්මයාණෙනි/ මහත්මියණි,

## <u>අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා වෛද්‍ය පීඨයට මෘත ශරීර පරිත්‍යාග කිරීමේ තොරතුරු පත්‍රිකාව</u>

ඔබගේ ශරීරය මරණින් පසු අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා භාරදීමට ඔබ විසින් ගෙන ඇති තීරණය පිළිබඳව ස්තූතිවන්ත වෙමු. මෘත ශරීරයක් වෛද්‍ය පීඨය වෙත භාරදීම සඳහා භාරකරුවන්ගේ එකඟතාවයද අවශ්‍ය වන අතර ඔවුන් විසින් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය පහත දක්වා ඇත.

1. මෘත ශරීරය භාර දීම පිණිස දිනය සහ වේලාව වෛද්‍ය පීඨ කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුවට පැමිණ හෝ දුරකතනයෙන් අමතා [**2696243, 2688748, 2688749 හෝ 2695300 (දිගුව 119/120)**] නියම කරගත යුතුය. ඒ සඳහා **සතියේ දින වල පෙ.ව.8.30 සිට ප.ව. 3.30 දක්වා** ඇමතිය හැකි අතර, මෘත ශරීර භාරගනු ලබන්නේ **සතියේ දිනවල (**රජයේ නිවාඩු හැර**) පෙ.ව.9.00 සිට ප.ව. 2.00 දක්වා** පමණි. සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි දී මෘත ශරීර භාරගනු නොලබන බව කරුණාවෙන් සලකන්න.
2. මෘත ශරීරයක් භාරදීමට පැමිණෙන තැනැත්තා අනිවාර්යයෙන්ම පහත සඳහන් ලිපි ලේඛණ කාර්යාලයට භාරදිය යුතු අතර එම ලිපිලේඛණ කිසිදු හේතුවක් මත නැවත භාරකරුවන් හට ලබා <u>නොදෙන</u> බවද කරුණාවෙන් සලකන්න.
    I. **මරණ ලියාපදිංචි කිරීමේ ලේඛණයේ මුල් පිටපත හෝ මරණ දැන්වීමේ සහතිකය (41 (1) (අ) වගන්තිය).**
        - දේහය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට භාර දෙන බව එම ලේඛණයේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.
        - මෙම සහතිකය නොමැතිව කිසිදු හේතුවක් මත දේහය භාරගනු **නොලැබේ**.

    II. **මෘත දේහයේ නීත්‍යානුකූල භාරකරු තමා බවට, දිවුරුම් ප්‍රකාශයක්** (සාමවිනිසුරුවෙකු විසින් සහතික කළ යුතුය).

    III. **මෘත දේහය භාරදෙන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක්** (සාමවිනිසුරුවෙකු විසින් සහතික කළ යුතුය).

    IV. වයස 18ට අඩු අයෙකුගේ මෘත දේහයක් භාර දෙන්නේ නම් දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත් වල ඡායාපිටපත් සහ දෙමාපියන්ගේ විවාහ සහතිකයේ ඡායාපිටපතක්ද ඉදිරිපත් කළ යුතුය (සාමවිනිසුරුවෙකු විසින් සහතික කළ යුතුය).
3. දේහය වෛද්‍ය පීඨයට **<u>රැගෙන ඒමට පෙර</u>** ඉහත ලිපි ලේඛණ නිවැරදිදැයි තහවුරු කර ගැනීම සඳහා අදාල ලිපි ලේඛණ රැගෙන කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුවේ කාර්යාලයට පැමිණිය යුතුය.

4. මරණය සිදුවී **පැය හතලිස් අටක්** ඇතුළත දේහය භාරදිය යුතු අතර පැය **අටක්** ඇතුළත දේහය භාර දෙනු ලබන්නේ නම් ස්වරක්ෂණය (එම්බාම්) කිරීම අවශ්‍ය නැත. ස්වරක්ෂණය කරන්නේ නම් එය කළ යුත්තේ **ශරීරයේ වෙනත් කිසිම අවයවයක් කපා ඉවත් නොකර** කලව පෙදෙසෙහි ඉහළ කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වරක්ෂ තරලය විදීමෙන් පමණි. දේහය අධ්‍යයන කටයුතු සඳහා පරිත්‍යාග කරන බව ස්වරකෂණය (එම්බාම්) කරන ආයතනයට දැන්විය යුතුය.
5. පහත සඳහන් දේහයන් භාර ගැනීමේදී අවසාන තීරණය අංශ ප්‍රධානී සතු වන බව කරුණාවෙන් සලකන්න.
   i. පශ්චාත් මරණ පරීක්ෂණයට බඳුන් කළ දේහ.
   ii. සෙංගමාලය/එච්.අයි.වී. එඩ්ස් වැනි බෝවන රෝග වලින් පෙළුණු රෝගීන්ගේ දේහ.
   iii. ඇඳ වණ හෝ මෑතකදී සිදුකළ ශල්‍ය කර්ම නිසා ඇති වූ විවෘත තුවාල ඇති දේහ.
   iv. අධික සන්ධි විකෘතිතා හේතුවෙන් පැතලි පෘෂ්ඨීයක තැබීමට නොහැකි දේහ.
   v. බද්ධ කිරීම් ඉන්ද්‍රියන් දන් දී ඇති අයගේ දේහ (අක්ෂිදාන සංගමයට ඇස් ප්‍රදානය කරනු ලැබූ දේහයන් භාරගැනීමට බාධාවක් නොමැත).
   vi. විශාල ශල්‍ය කර්මයකට බඳුන් වූ දේහ හෝ අතපය කපා ඉවත් කළ දේහ.
   vii. අධික ස්ථුල හෝ කෘෂ දේහ.
   viii. ඇතැම් පිළිකා වර්ග වලින් පෙලුනු රෝගීන්ගේ දේහ.
6. භාර දීමට ගෙන ආ මෘත දේහය අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සඳහා සුදුසු තත්වයක නැතිනම් හෝ නරක් වෙමින් පවතින්නේ නම් එය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වෛද්‍ය පීඨය සතුව ඇති අතර, එවැනි අවස්ථාවකදී දේහය වෛද්‍ය පීඨයෙන් වහාම ඉවත් කර ගැනීමේ වගකීම මෘත දේහයේ භාරකරුවන්ට පැවරේ.
7. මෘත දේහය ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් පීඨය මගින් සපයා නොදෙන බව කරුණාවෙන් සලකන්න.
8. මෘත දේහය භාරදීමෙන් පසුව නැවත එයට බුහුමන් දැක්වීමට අවසර දීම, දිගු කාලීනව මෘත දේහ තබාගැනීමට කටයුතු කිරීම හෝ දේහයේ කොටස්/කොටසක් ආපසු ඔබගේ භාරකරුවන් හට ලබා දීම කළ නොහැක.
9. මෘත දේහය දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු මෘත දේහය රැගෙන ආ පෙට්ටිය භාරකරුවන් විසින් දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් රැගෙන යායුතුය. මේ සඳහා අවමංගල්‍ය කටයුතු කිරීමට භාරදී ඇති ආයතනය සමඟ හෝ ඔබ කැමති ආයතනයක් (වැඩිහිටි නිවාස/රෝහල්) සමඟ අවශ්‍ය ඉදිරි කටයුතු සලසා ගැනීම ඔබගේ භාරකරුවන්ට පැවරේ.
10. අධ්‍යාපනික කටයුතු සඳහා මෘත ශරීර සහ එහි කොටස් විශේෂ ආකාරයෙන් සකසා සෞඛ්‍ය/ වෛද්‍ය අධ්‍යාපන කටයුතු සඳහා පාසල් සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වලට ලබා දෙන අවස්ථා වලදී ඒ සඳහා වැය වන මුදල අදාළ පාර්ශවයන් ගෙන් අයකර ගනු ලැබේ. ඒ පිළිබඳව ඔබගේ විරුද්ධත්වයක් නැතැයි අපි අපේක්ෂා කරමු.

11. ඔබගේ මෙම සත් ක්‍රියාව සමාජ මෙහෙවරකි. මේ සඳහා ඔබ හෝ ඔබේ පවුලේ සමාජිකයින් කිසිදු ගෙවීමක් වෛද්‍ය පිඨයට හෝ වෛද්‍ය පිඨ කාර්යය මණ්ඩලයට **සිදුනොකළ යුතුය.**

ස්තුතියි.

මෙයට
විශ්වාසි,


**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වජිර එච්. ඩබ්. දිසානායක**
අංශප්‍රධාන
කායවච්ඡේද දෙපාර්තමේන්තුව,
වෛද්‍ය පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කින්සි පාර,
කොළඹ 8.

# කායවච්ඡේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
කිංසි පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව.
දුරකථන: +94-0-11-2695300 දිගුව : 119, 120 ෆැක්ස් : +94-0-11-2691581
විද්‍යුත් ලිපිනය :head@anat.cmb.ac.lk


## අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත ශරීර පරිත්‍යාග කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම.

සම්පූර්ණ නම : ..............................................................................................................................
..............................................................................................................................

ජා.හැ. අංකය : ..............................................................................................................................

දුරකතන අංකය : ..............................................................................................................................

ලිපිනය : ..............................................................................................................................
..............................................................................................................................

ඉහත විස්තර සදහන් වන මා “අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත ශරීරය පරිත්‍යාග කිරීම” පිළිබඳ තොරතුරු පත්‍රිකාව කියවා තේරුම්ගත් අතර මාගේ මෘත දේහය වෛද්‍ය පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සඳහා පරිත්‍යාග කිරීමට මාගේ අත්සන තබා මෙයින් කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.

........................................ ........................................
අත්සන දිනය

සාක්ෂි:-

1.

නම : .............................................

ලිපිනය : .............................................
.............................................
.............................................
.............................................

ජා. හැ. අංකය: .............................................

ඥාතීත්වය : .............................................

දුරකථන අංකය : .............................................

2.

නම : .............................................

ලිපිනය : .............................................
.............................................
.............................................

ජා. හැ. අංකය: .............................................

ඥාතීත්වය : .............................................

දුරකථන අංකය : .............................................

**(මෙම පත්‍රිකාව පුරවා භාරකරුවන් හට භාර දෙන්න, නැතිනම් පෙනෙන තැනක එල්ළා තබන්න. මෘත දේහය පරිත්‍යාග කිරීමට පැමිණෙන විට මෙම පත්‍රිකාවද භාරකරුවන් විසින් රැගෙන ඒමෙන් කාර්යාලීය කටයුතු සඳහා පහසුවක් වනු ඇත.)**